**සීමාසහිත නෝර්ත් සී සමාගමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2021/ 2022**

**-----------------------------------------------------------------------------**

සීමාසහිත නෝර්ත් සී සමාගමේ 2022 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මෙහෙයුම් ක්‍රියාකාරකම් පිළිබඳ විගණනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් පිළිබඳ නිසි පොත්පත් සහ වාර්තා පවත්වාගෙන යා යුතුය.

16 (2) උප වගන්තිය ප්‍රකාරව සෑම විගණනය කරනු ලබන ආස්ථිතයක් සම්බන්ධයෙන් වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික කාර්ය සාධන වාර්තා ද සමග ගණන් දීමේ නිලධාරියා විසින් විගණකාධිපති වෙත රීති මගින් දක්වා ඇති කාල සීමාවන් තුළ ඉදිරිපත් කළ යුතුය.

38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික සහ වෙනත් මූල්‍ය ප්‍රකාශන අවශ්‍ය වේලාවන් ඇතුළත පිළියෙල කිරීම සිදු වන බවට සහතික වියයුතු අතර, ඊට අමතරව විගණනය කරනු ලබන ආස්ථිතයට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා වගබලා ගත යුතුය.

2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සමඟ නිකුත් කරන ලද රාජ්‍ය හිමිකාරීත්ව ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 6.6 වගන්තියේ විධිවිධානයන්ට අනුව පාලක මණ්ඩලය විසින් අනුමත කරන ලද 2022 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මෙම වාර්තාවේ දිනය දක්වා විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

## 1.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති රීති, රෙගුලාසි | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 6.6 වගන්තිය. | චක්‍රලේඛය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුලත සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම එසේ ක්‍රියා කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ගිණුම් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත සමාගමේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත 13(2) වගන්තිය | 2022 මාර්තු 31 දිනෙන් අවසන් කාර්තුව සඳහා වූ මුද්දර ගාස්තු සමඟ සහතික කළ එකතු කිරීම් ප්‍රකාශය විගණන දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | එක් එක් කාර්තුව අවසන් වී දින පහළොවක් ඇතුළත මුද්දර ගාස්තු, එකතු කිරීමේ සහතිකයත් සමඟ කාර්තුමය වශයෙන් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත 15 වගන්තිය | මෙම පනත යටතේ සේවායෝජකයා විසින් මෙම පනත අදාළ වන සේවකයාගේ සෑම මාසයකම දායකත්වය එම සේවකයාගේ ඉපැයීම්වලින් අඩු කර ඊළඟ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට ගෙවිය යුතුය. එම සේවකයා වෙනුවෙන් සේවායෝජක විසින් අරමුදලට ගෙවන ලද දායකත්වයද සේවායෝජක විසින් අරමුදලට ගෙවා ඇති ඊට පටහැනිව 2020 ජූලි සිට 2022 මාර්තු දක්වා කාලයට අදාළව සේවක අර්ථසාධක අරමුදලට රු.37,507,750ක දායකත්ව මුදලක් විගණිත දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් සමාගම විසින් පියවා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | සේවකයාගේ ඉපැයීම්වලින් අර්ථසාධක දායකත්ව මුදල අඩු කර ඊළඟ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. |
| 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත 16(1) වගන්තිය | මෙම පනත අදාළ වන සෑම සේවකයෙකුගෙන්ම සේවා යෝජකයා විසින් එම සේවකයා සේවයේ යොදවා ඇති සෑම මාසයකම, එම සේවකයා සම්බන්ධයෙන්, ඊළඟ මාසයේ අවසාන දිනට හෝ ඊට පෙර මෙම අරමුදලට ගෙවීමට බැඳී සිටියි. මාසයක් තුළ සේවයේ යෙදීම වෙනුවෙන් සේවකයා උපයනු ලබන මුළු ඉපැයීම්වලින් සියයට තුනකට සමාන මුදලක් එලෙස ගෙවීමට සේවා යෝජක දායක වේ. ඊට පටහැනිව 2021 සැප්තැම්බර් සිට 2022 මාර්තු දක්වා කාලයට අදාළව සේවක භාරකාර අරමුදලට රු.1,988,019ක දායකත්ව මුදලක් විගණනිත දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් සමාගම විසින් පියවා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | එක් එක් සේවකයාට අදාළ සේවක භාරකාර දායකත්ව මුදල අඩු කර ඊළඟ මාසයේ අවසාන දිනට පෙර අරමුදලට ප්‍රේෂණය කළ යුතුය. |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනත 18(4) වගන්තිය | ඉන්වොයිසිය නිකුත් කළ දින සිට දින තිහක් ඇතුළත විගණන කරනු ලබන ආයතනය විගණන ගාස්තු පියවිය යුතුය. ඊට පටහනිව 2015/2016 සිට 2020/2021 දක්වා කාලයට අදාළ විගණන ගාස්තු රු.1,979,100ක් විගණිත දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් සමාගම විසින් පියවා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | නෝර්ත්-සී ලිමිටඩ් ආයතනය විසින් ඉන්වොයිසියේ දින සිට දින තිහක් ඇතුළත විගණන ගාස්තු ගෙවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| 2007 අංක 7 දරන සමාගම් පනත 50(i) වගන්තිය | සමාගම විසින් කොටස් නිකුත් කිරීමේදී සංස්ථාගත කිරීම සඳහා වන අයදුම්පතෙහි නම් කර ඇති සෑම කොටස් හිමියෙකුටම 5 වන වගන්තිය යටතේ සමාගමක් සංස්ථාගත කළ වහාම එම පුද්ගලයාට හිමි කොටස් සහතික නිකුත් කළ යුතුය. සමාගම 2001 දී සංස්ථාපිත කර සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි වූ බැවින් සමාගම කොටස් නිකුත් කර තිබුණ ද එහි කොටස් හිමියන්ට කොටස් සහතික නිකුත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | කොටස් හිමියන්ට කොටස් සහතික නිකුත් කළ යුතුය. |
| ජාතික ප්‍රසම්පාදන නියෝජිතායතනයේ 2006 මාර්තු 01 දිනැති අංක 09 දරන චක්‍රලේඛය | පූර්ණ රාජ්‍ය සමාගමක් භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන අත්පොත (2006 භාණ්ඩ සහ වැඩ සඳහා වූ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සමඟ භාවිතා කළ යුතු) අනුගමනය කළ යුතුය. ඊට පටහැනිව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය නොකර රු.40,528,467 නුල් අමුද්‍රව්‍ය සමාගම විසින් මිලදී ගෙන තිබුණි . | පිළිතුරු ලබා දී නොමැත. | සමාගමට භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතුය. |

**1.4 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

| බදු අවශ්‍යතාවය | අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (VAT) පනත | සමාගම විසින් 2021 වර්ෂය අවසානය වන විට රු. 182,799,880ක එකතු කළ අගය මත බදු ගෙවා නොතිබුණි. තවද එකතු කළ අගය මත බදු කාලීනව නොගෙවීම හේතුවෙන් දඩ මුදල ලෙස රු.27,693,374ක් ද ගෙවීමට සිදුවී තිබුණි. නමුත් විගණිත දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් මෙම මුදල පියවීමට සමාගම කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනවශ්‍ය දඩ ගෙවීම් වලක්වා ගැනීම සඳහා අදාළ බදු නීතීන් සමඟ කළමනාකරණය අනුකූල විය යුතුය. |
| 2009 අංක 9 දරන ජාතිය ගොඩ නැගීමේ බදු (NBT) පනත | සමාගම විසින් 2022 වර්ෂය අවසානය වන විට රු.28,580,611ක ජාතිය ගොඩ නැගීමේ බදු ගෙවා නොතිබුණි. තවද ජාතිය ගොඩ නැගීමේ බදු කාලීනව නොගෙවීම හේතුවෙන් දඩ මුදල ලෙස රු.4,713,899ක් ද ගෙවීමට සිදුවී තිබුණි. නමුත් විගණිත දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් මෙම මුදල පියවීමට සමාගම කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | අනවශ්‍ය දඩ ගෙවීම් වලක්වා ගැනීම සඳහා අදාළ බදු නීතියට කළමනාකරණය අනුකූල විය යුතුය. |

## 2. පෙර වර්ෂය සඳහා මූල්‍ය සමාලෝචනය

### 2.1 පෙර වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

| අයිතමය | 2020/2021<br>රු | 2019/2020<br>රු | වැඩිවීම/(අඩුවීම)<br>රු | ප්‍රතිශතයේ වැඩිවීම/(අඩුවීම)<br>% |
|---|---|---|---|---|
| දළ පිරිවැටුම | 243,062,940.00 | 260,508,899.00 | (17,445,959.00) | (6.69) |
| නිෂ්පාදනය සඳහා ශ්‍රමය | 90,947,851.00 | 89,694,050.00 | 1,253,801.00 | 1.39 |
| නිෂ්පාදනය සඳහා පොදුකාර්යය | 75,749,621.00 | 68,705,237.00 | 7,044,384.00 | 10.25 |
| කොමිස් | 3,128,088.00 | 4,433,304.00 | (1,305,216.00) | (29.44) |
| විකුණුම් ප්‍රවර්ධනය | - | 79,763.00 | (79,763.00) | (100.00) |
| අධ්‍යක්ෂ දීමනා | 2,238,009.00 | 1,811,456.00 | 426,553.00 | 23.54 |
| නීති ගාස්තු | 699,000.00 | 289,800.00 | 409,200.00 | 141.20 |
| විගණන කමිටු වියදම් | - | 27,000.00 | (27,000.00) | (100.00) |
| කුලී | 2,000,000.00 | 600,000.00 | 1,400,000.00 | 233.33 |
| අධිභාර | 27,727.00 | 17,156.00 | 10,571.00 | 61.61 |

### 2.2 පෙර වර්ෂය සහ ඊට පෙර වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වයේ සාරාංශය

| | 2020/2021<br>රු | 2019/2020<br>රු |
|---|---|---|
| ලාභ / අලාභ | (89,278,872) | (118,160,662) |
| ජංගම නොවන වත්කම් | 250,938,389 | 284,221,300 |
| ජංගම වත්කම් | 89,194,058 | 82,457,994 |
| වෙළඳ සහ වෙනත් ලැබිය යුතු දෑ | 21,474,469 | 17,496,304 |
| මුදල් සහ මුදල් සමාන දෑ | 1,132,004 | 1,591,248 |
| ජංගම නොවන වගකීම් | 482,478,567 | 469,688,332 |
| ජංගම වගකීම් | 117,410,416 | 73,312,603 |
| දීර්ඝ කාලීන ණය | 3,000,000 | 3,000,000 |
| ණය හිමියෝ | 68,299,901 | 64,177,709 |
| අනෙකුත් ගෙවිය යුතු දෑ | 247,197,644 | 248,819,172 |
| L/C ණය ගිණුම | 54,828,182 | 56,399,310 |
| SLS බැංකු ණය | 48,304,972 | 10,000,000 |
| සේවක වරප්‍රසාද | 32,359,007 | 42,786,984 |
| වැටුප් ණය | 28,785,649 | - |
| ගෙවිය යුතු ගිණුම් | 58,974,056 | 44,054,762 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සමාගම විසින් මෙම ගොඩනැගිලි පරිශ්‍රය ජාතික වාණිජ මණ්ඩලයෙන් බදු පදනම මත ලබාගෙන ඇති බවත් බදු ගිවිසුම 2022 පෙබරවාරි 28 දිනෙන් අවසන් වූ බවත් නිරීක්ෂණය විය. එය අලුත් කිරීමට හෝ කාලය දීර්ඝ කිරීමට සමාගම පියවර ගෙන නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | බදු ගිවිසුම අලුත් කිරීම හෝ කාලය දීර්ඝ කළ යුතුය. |
| කර්මාන්ත ශාලා පවත්වාගෙන යන වීරවිල සහ යාපනය ප්‍රදේශවල රජයට අයත් ඉඩම්වල සමාගම විසින් ගොඩනැගිලි ඉදිකර තිබුණද බාධාවකින් තොරව ක්‍රියාත්මක වීමට එම ඉඩම්වල අයිතිය සමාගමේ නමට පවරා හෝ බදු දී නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | ඉඩමේ අයිතිය සමාගමේ නමට පැවරීමටත්, අනාගතයේදී කිසිදු නීතිමය ගැටලුවක් ඇතිවීම වළක්වා ගැනීමටත්, ගොඩනැගිලි ආයෝජනය ආරක්ෂා කර ගැනීමටත්, එම පරිශ්‍රයේම ව්‍යාපාරය කරගෙන යාමටත් කළමනාකාරිත්වය පියවර ගත යුතුය. |

### 3.2 මානව සම්පත් කලමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සමාගම විසින් යෝජිත සේවක සංඛ්‍යාව අනුමත කර ගැනීම සඳහා ධීවර අමාත්‍යාංශය හරහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත 2022 මාර්තු 25 දිනැති ලිපිය ඉදිරිපත් කරන ලදී. ඒ අනුව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව 2022 මැයි 18 දිනැති අංක DMS/1747 ලිපිය මඟින් පසුගිය වසර 05 තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්ෂික වාර්තාව, ඉදිරි වසර 05 තුළ සමාගම විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන්, නිෂ්පාදනය, විකුණුම්, ලැබුණු ආදායම් සහ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ඒවායේ පසුගිය වසර 05 ක ප්‍රගතිය සහ සමාගමේ උපාය මාර්ගික සැලැස්ම ඇතුළත් සවිස්තර වාර්තාවක් ඉල්ලා තිබුණි. නමුත් සමාගම විගණිත දිනය වූ 2022 නොවැම්බර් 24 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත. | තනතුරු අනුමත කර ගැනීමට ඉල්ලා සිටින තොරතුරු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට සමාගම කටයුතු කළ යුතුය. |